කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - පළමු සෙමෙස්තරය 2021/2022

**SOC 3159 - උපදේශනයේ මූලිකාංග**

කාලය : පැ දෙකයි (02)

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

---

පළමු ප්‍රශ්නයට අනිවාර්යයෙන් පිළිතුරු සැපයිය යුතුය.

සිද්ධි අධ්‍යයනය

1. අනුලා, ගාල්ලේ ජීවත් වන නව යොවුන් තරුණියකි. ඇය මාර්ගගත පන්ති වලට සහභාගි වන අතර ජංගම දුරකථනය හරහා ඇයගේ මිතුරන් සමග සංවාදයේ යෙදෙයි. ඇය දිගින් දිගටම සම්බන්ධතා වලින් දුරස් වෙමින් නිවසටම වී කාලය ගත කරයි. ඇය තවදුරටත් කිසිවෙකු මුණ නොගැසීම පිළිබඳවත් කතා නොකර සිටීම පිළිබඳවත් දෙමාපියන් දැඩි කනස්සල්ලෙන් පසුවෙති. එබැවින් ඇයව උපදේශකවරයෙකු වෙත යොමු කිරීමට දෙමාපියන් තීරණය කරති.

   1.1 මෙම සිද්ධියට අදාළ මූලික ගැටලු මොනවාදැයි පැහැදිලි කරන්න.

   1.2 ඔබ උපදේශකවරයෙකු නම්, ඔබ මෙම සේවාලාභියා සඳහා භාවිතා කරනු ලබන උපදේශන න්‍යායන් පැහැදිලි කරන්න.

   1.3 මෙම න්‍යායන් ඇගේ මෙම ගැටලුව ආමන්ත්‍රණය කිරීම සඳහා භාවිතා කරන්නේ කෙසේදැයි විස්තර කරන්න.

2. උපදේශනය අනෙකුත් උපකාරක ක්‍රියාකාරකම් වලින් වෙනස්වන්නේ කෙසේද? නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න.

3. යහපත් උපදේශකවරයෙකු සතු විය යුතු ගුණාංග 03ක් සඳහන් කරමින්, සාර්ථක උපදේශකවරයෙකු වීම සඳහා එම ගුණාංග වැදගත් වන ආකාරය උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

4. සවන්දීම සහ ක්‍රියාකාරී සවන්දීම අතර ඇති වෙනස්කම් උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

5. සහකම්පනය (Empathy) යන්න කුමක්දැයි නිර්වචනය කර උපදේශකවරයෙකු සේවාලාභියා කෙරෙහි සිය සහානුකම්පීවීම වැදගත් වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

6. උපදේශකවරයෙකු සහ සේවාලාභියෙකු අතර ඇති සම්බන්ධතාවය ගොඩනැංවීම සඳහා සන්නිවේදන කුසලතා වැදගත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

*************